ජාත්‍යන්තර කාන්තා මාසයේ මේ පළමු දිනයේ ඔබ හැමදෙනාටම සුභ සන්ධ්‍යාවක් වේවා! මේ අවස්ථාව සංවිධානය කිරීම සහ කාන්තාවන් ශ්‍රම බලකායේ රඳවාගැනීම හා නැවතත් ඇතුළත් කරගැනීම යන වැදගත් මාතෘකාව ගවේෂණය කිරීම සඳහා ඔබ සමගින් එක්වන්නට මට ආරාධනා කළ ඇමෙරිකානු වාණිජ මණ්ඩලයටත්, විශේෂයෙන්ම රායිටත් ස්තුතියි. බොහෝවිට අපි කාන්තා අයිතිවාසිකම් සහ කාන්තා උද්දේශනය යනු කාන්තාවන්ට පමණක් අදාළ දෙයක් කියා සිතනවා, නමුත් එය එසේ නොවේ, එනිසා අද දින මෙම ස්ථානයේ කාන්තාවන් සහ පුරුෂයින් යන දෙපාර්ශවයම දකින්නට ලැබීම ගැන මා සතුටු වනවා. කාන්තා සහ පුරුෂ යන දෙපාර්ශවයෙන්ම අපට මිතුරන් සහ හඬ නගන්නන් අවශ්‍යයි, එමෙන්ම පෞද්ගලික අංශය, ශාස්ත්‍රීය අංශය, සිවිල් සමාජය, හා රජය යන සියළුදෙනා මෙය පොදු අභියෝගයක් වශයෙන් සලකා මේ සඳහා හවුලේ විසඳුමක් සෙවීම අවශ්‍යයි.

මුලින්ම මා කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම පිළිබඳ ගැටළුව සඳහා පසුබිම ඉදිරිපත් කරන්නට කැමතියි. ලෝක ජනගහණයෙන් හරි අඩකට මදක් වැඩියෙන් සමන්විත වන්නේ කාන්තාවන්ගෙන් වන නමුත් පූර්ණ ආර්ථික සහභාගීත්වය සඳහා කාන්තාවන්ට දිගින්දිගටම බාධකවලට මුහුණ දෙන්නට සිදුව තිබෙනවා. ගෝලීය වශයෙන් පුරුෂයින් උපයන සෑම ඩොලරයකටම සාපේක්ෂව කාන්තාවන් (තවමත්) උපයා ගන්නේ ශත 77ක් පමණයි. ඒ අඩු වැටුප් සහිතත අඩු පුහුණුව සහිත රැකියාවල නිරත වීමෙන්. මෙය ඔවුන්ගේ ආර්ථික අවස්ථා සීමා කරනවා පමණක් නොවේ, ජාතික මට්ටමින් ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා ද එය බාධා කරනවා.

දැන් අපි 75 වසරකට පෙර තත්වය බලමු. ශ්‍රී ලංකාවට නිදහස ලැබුණේ ඒ කාලයේයි, එමෙන්ම එක්සත් ජනපද-ශ්‍රී ලංකා රාජතාන්ත්‍රික සම්බන්ධතා ඇතිකරගත්තේ ද ඒ වසරේයි. එවකට ශ්‍රී ලංකාවේ දත්ත මා සතුව නැතත්, 1948 දී එක්සත් ජනපදයේ ශ්‍රම බලකායෙන් 33%ක් සමන්විත වූයේ කාන්තාවන්ගෙන්; පනස් වසරක් ගතවද්දී එම අගය දෙගුණයක් පමණ වනවා. ශ්‍රී ලංකාවේ වත්මන් අගය කොපමණදැයි අනුමාන කරන්නට පුළුවන්ද? පුරුෂයින්ගේ සහභාගීත්වය වන 71%ට සාපේක්ෂව ශ්‍රම බලකායට සහභාගිවන්නේ කාන්තාවන්ගෙන් 32%ක් පමණයි. එනම්, ශ්‍රී ලංකාවේ වත්මන් අගය, 1948 දී එක්සත් ජනපදයේ ශ්‍රම බලකා සහභාගීත්ව ප්‍රතිශතයට සමානයි. මෙම ස්ත්‍රීපුරුෂ සමාජභාව පරතරය අවාසිසහගත,

සිත් අධෛර්යමත් කරවන සහ අසාධාරණ තත්වයක් වනවා පමණක් නොවේ, ඉන් ශ්‍රී ලංකා ආර්ථිකයේ විභවය ද සීමා කරනවා. ශ්‍රී ලාංකික කතුන් ජ්‍යෙෂ්ඨ තනතුරු හා තානාපති තනතුරු ලබාගනිමින් සැහෙන ප්‍රගතියක් ළඟා කරගන්නා අන්දම අප දුටුවා. Colombo Club හි 152 වසරක ඉතිහාසයේ පළමු වතාවට මේ වසරේ එහි සභාපති ධුරය සඳහා කාන්තාවක් තෝරා පත්වූවා, එමෙන්ම, මෑතකදී අප කළ ඒකාබද්ධ නාවික අභ්‍යාසයට පළමු වතාවට ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් කිමිදුම්කාරිනියක සම්බන්ධ වූවා. එමෙන්ම, කාන්තාවන්ගේ ආර්ථික සහභාගීත්වය වැඩිකිරීම හරහා ශ්‍රී ලංකාවට 2025 වනවිට තම දළ දේශීය නිෂ්පාදිතයට බිලියන 20ක් එක් කරගැනීමේ හැකියාව තිබෙන බව අප අමතක නොකළ යුතුයි. මේ අවස්ථාවේ ඩොලර් බිලියන 20ක් පමණ ආර්ථිකයට එක් කරගත් හැකිනම් එය ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් බවට ඔබ කවුරුත් එකඟ වේවි.

දැන් අපි ප්‍රශ්නය කුමක්දැයි දන්නවා. ඒ ගැන අපට කළ හැක්කේ කුමක්ද? ඔවුන්ගේ වෘත්තීමය ජීවිතය ඉදිරියට ගෙනයෑමෙන් කාන්තාවන් අධෛර්යමත් කරන ළමයින් රැකබලාගැනීම, වැඩිහිටියන් රැකබලාගැනීම සහ අනෙකුත් ආතතීන් පවතින කල, දක්ෂතා සම්පන්න කාන්තාවන් අප සේවාස්ථානවල රඳවාගන්නේ කෙසේද? ළමා රැකවරණ වැඩසටහන්, ඒවා සඳහා සහන හා නම්‍යශීලී සේවා කාලසටහන් හඳුන්වාදීමට සමාගම්වලට හැකියි. කාන්තාවන් විසින්ම නිවසේ වැඩකටයුතුවලින් හා ළමයින් රැකබලාගැනීමේ වගකීම්වලින් වැඩි හරියක් දැරියයුතු බව කියන සමාජ සම්මත අපට අභියෝග කළ හැකියි. උසස්වීම් සඳහා තරඟ කිරීමට හා සැන්දෑවේ අතිකාල සේවා කිරීමට කාන්තාවන්ට සමාන අවස්ථා ලබාදීමට අපට හැකියි. පිරිමින් මෙන්ම කාන්තාවන් හොඳින් වැඩ කරන විට අපට ඔවුන්ව පිළිගැනීමට ලක් කිරීමට සහ ඇගයීමට හැකියි. කාර්යාලයේ කාන්තා සගයින්ට අයුතු ලෙස සලකනු හෝ ඔවුන්ට සමාන හෝ ඊට වැඩි සුදුසුකම් තිබියදීත් අවස්ථාවන් අහිමිකරනු හෝ දුටුවොත් ඒ ගැන කථා කිරීමට පුරුෂයින් යොමුකරන්නට අපට හැකියි. සීමාවාසික අවස්ථා සහ මගපෙන්වීමේ වැඩසටහන් හරහා අපට තරුණ කාන්තාවන්ට දියුණුවන්නට උපකාර කළ හැකියි. Amcham අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින තනි කාන්තා සාමාජිකාව ඊට වැඩි ගණනක් දක්වා වැඩි කළ හැකියි.

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට සම්පත් හා පුහුණුව කරා ප්‍රවේශ වන්නට උපකාර කරමින් ඔවුන් ශ්‍රම බලකාය කරා ගෙනයන්නටත් එහි රැඳී සිටින්නට ඔවුන් යොමුකරගන්නටත් එක්සත් ජනපදය වෙහෙසී ඇති බව මා

කියන්නේ ආඩම්බරයෙන්. මුලින්ම අප කාන්තා ව්‍යවසායිකාවන්ට මූල්‍ය කරා ප්‍රවේශය වැඩි කර දෙන්නට අරමුණු කරනවා. ව්‍යාපාරයක් ආරම්භ කිරීමටත් වර්ධනය කිරීමටත් ප්‍රාග්ධනය කරා ප්‍රවේශය ඉතාමත් වැදගත් වනවා. නමුත් පුරුෂයින්ට සාපේක්ෂව කාන්තා ව්‍යවසායිකාවන් මූල්‍යකරණය ලබාගැනීමේදී වඩාත් වැඩි බාධකවලට මුහුණ දෙනවා. මූල්‍යකරණය ලබාගැනීමට තමන් යා යුත්තේ කොහේටදැයි නොදන්නා බව කුඩා ව්‍යාපාර හිමි කතුන් පවසනවා මටම ඇසී තිබෙනවා. මේ තත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා, එක්සත් ජනපදය කාන්තාවන්ට හිමි ව්‍යාපාර සඳහා ණය ලබාදීම වැඩි කරන්නට ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන සමගින් එක්ව වැඩ කරනවා. ශ්‍රී ලංකාවේ පළමු වරට කාන්තාවන් කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක වන ව්‍යාපාර වර්ධකය (business accelerator) වන AccelerateHer එළිදැක්වීමට Hatch Works වෙත අරමුදල් ලබාදෙන්නට හැකිවීම ගැන අපි සතුටු වනවා. කොළඹ අවට ඇතැම් වෙළඳපලවලදී මට හමුවූ කාන්තාවන් බොහෝ දෙනෙක් වසංගත කාලයේදී තමන්ගේ අවශ්‍යතා හේතුවෙන් හෝ නිවසේදී කම්මැලිකම මකාගැනීම සඳහා නිවසේ සිට මාර්ගගතව (online) තමන්ගේ ව්‍යාපාර ආරම්භ කළ අය; අද ඔවුන් දියුණු වෙමින් ව්‍යවසායකත්වයේ නව මංපෙත් එළිකරමින් සිටිනවා.

දෙවැනුව අපි විධිමත් ආර්ථිකය තුළ කාන්තා සහභාගීත්වය වැඩි කරන්නට අරමුණු කරනවා. අවිධිමත් ආර්ථිකය තුළ ශ්‍රී ලාංකික කතුන් නියෝජනය වී ඇත්තේ අසමානුපාතිකවයි. එහි බොහෝවිට ඔවුන්ට නෛතික ආරක්ෂාවක් හෝ වැටුප් සහිත නිවාඩු හා සමාජ ආරක්ෂණය වැනි ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. කාන්තා හිමිකාරත්වය සහිත ව්‍යාපාරවලට නීතිමය සහ නියාමනමය සහය ලබාදීම ද ඇතුළුව ආර්ථිකය විධිමත්කරණ වැයම් සඳහා අප සහය දෙනවා.

තුන්වැනුව, අප ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරනවා. ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගීත්වයට මෙන්ම පොදුවේ කාන්තාවන්ගේ සුබසෙත කෙරෙහි සැලකියයුතු බාධක එල්ල කරනවා. සිවිල් සමාජය සහ ශ්‍රී ලංකාවේ රජය සමගින් ඇතිකරගන්නා හවුල්කාරීත්ව හරහා ද ඇතුළුව, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමේ හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ මුලපිරීම් සඳහා එක්සත් ජනපදය සහය දෙනවා.

අවසාන වශයෙන්, කාන්තාවන්ගේ නායකත්ව සහ තීරණ ගැනීමේ කුසලතා ප්‍රවර්ධනයට අප අරමුණු කරනවා. බොහෝවිට කාන්තාවන් රජයේ සහ පෞද්ගලික අංශයේ නායකත්ව තනතුරු නියෝජනය කරන්නේ අඩුවෙන්. පුහුණු සහ මගපෙන්වීමේ වැඩසටහන් හරහා ද ඇතුළුව කාන්තා නායකත්වය සහ තීරණ ගැනීමේ හැකියාව ප්‍රවර්ධනය කරන මුලපිරීම් සඳහා එක්සත් ජනපදය සහය දෙනවා. ශ්‍රී ලාංකික කාන්තාවන්ට ප්‍රායෝගික කුසලතා සහ මෙවලම් ලබාදීම සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබාදෙන ගෝලීය වැඩසටහනක් වන We Connect International හි නියෝජිතයකු ද අද මෙම ස්ථානයේ සිටිනු මට පෙනෙනවා.

කාන්තාවන්ට සමාන ආර්ථික අවස්ථා පවතින විට කාන්තාවන්ට වඩාත් හොඳින් තමන්ට මෙන්ම තම පවුලට ද සහය ලබාදීමට හැකි වනවා. එය වඩාත් ශක්තිමත් ප්‍රජාවන් සහ ආර්ථිකයන් සඳහා මග පාදනවා. නායකත්ව තනතුරුවල වැඩියෙන් කාන්තාවන් සිටින සමාගම්වල ලාභදායීත්වය සහ සමස්ථ කාර්යසාධනය වඩාත් ඉහළ මට්ටමක පවතින බව පර්යේෂණවලින් පෙන්නුම් කර තිබෙනවා. මාගේ තානාපති කාර්යාලය තුළ ආරක්ෂාව, ඉදිකිරීමේ මෙහෙයුම්, කොන්සල් අංශය, මහජන කටයුතු, දේශපාලන සහ සාම සාධක ඇතුළු ප්‍රධාන අංශ ගණනාවක නායකත්වය කාන්තාවන් විසින් දැරීමත් සමගින්, අදහස්වල විවිධත්වය සහ වඩාත් හොඳින් ප්‍රශ්න විසඳීමේ හැකියාව අපේ ජ්‍යෙෂ්ඨ නායකත්වයට ලබාදෙන්නේ යැයි මා සිතනවා.

එනිසා අවසාන වශයෙන් මා මෙසේ කියන්නම්: කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම යනු අප කළයුතු නිවැරදි දෙය පමණක් නොවේ, අප කළයුතු බුද්ධිමත් දෙය එයයි. ජනගහනයෙන් අර්ධයක උපරිම විභවයෙන් ඵල නෙලාගන්නට යොමුවීම තුළ, ශ්‍රී ලංකාවට තම ආර්ථික වෘද්ධිය සහ සංවර්ධනය වඩාත් වේගවත් කරගනිමින් සියළුම පුරවැසියන්ගේ ජීවිත වඩාත් වැඩිදියුණු කළ හැකියි. මෙරට ගතළ මගේ පළමු වර්ෂයේ මා අත්විඳි දීප්තිමත්ම අවස්ථාවක් වූයේ මහනුවර ආසන්නයේ පාසැලක ශිෂ්‍ය නායිකාවන් කණ්ඩායමක් හමුවීමයි. මට කිසිදා ඔවුන්ගේ මුහුණු අමතක වන්නේ නැහැ. පිරිමි ළමුන්ට මෙන්ම තමන්ටත් විශාල සිහින තිබෙන බව ඔවුන් මට කියා සිටියා. පිරිමි ළමුන් තරම්ම තමනුත් දක්ෂ බව ඔවුන් මට කියා සිටියා. ඔවුන් නිවැරදියි කියා මා ඔවුන්ට කිවුවා.

එනිසා, මෙහි සිටින ඔබ හැමදෙනාටම මා අභියෝගයක් ඉදිරිපත් කරනවා. 2024 මාර්තු මාසයේ එළඹෙන මීළඟ ජාත්‍යන්තර කාන්තා දිනය වන විට ඔබේ සමාගමට සහ සංවිධානයට කළ හැක්කේ මොනවාද, ඔබ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති සහ වැඩසටහන් මොනවාද, කාන්තාවන් පූර්ණ වශයෙන් සවිබලගැන්වීමටත් දක්ෂතා සහිත සේවිකාවන් සේවයේ රඳවා තබාගන්නටත් අන් අය විසින් අනුගමනය කිරීම සඳහා නායකයින් සහ විධායක නිලධාරීන් ලෙස ඔබ ඇතිකරන පසුබිම කුමක්ද? අද පටන් වසරකින් මෙම ස්ථානයේදීම ඔබ සාක්ෂාත් කරගත් දෑ දැකගැනීමට මා උද්යෝගයෙන් පසුවනවා. ස්තුතියි.